**දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - 2015**

**-----------------------------------------------------**

දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා චීන අපනයන හා ආනයන බැංකුව අතර 2011 පෙබරවාරි 17 දින එළඹි පැකේජ 1 සඳහා වන අංක බීඑල්ජ් 201011 හා පැකේජ 2 සඳහා වන අංක බීඑල්ජ් 201012 දරන ණය ගිවිසුම් යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**-----------------------------------------------------------------------------------------**

දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට මහා මාර්ග හා වරාය කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවේ පළමු ප්‍රවේශ පාලන මහා මාර්ගය සඳහා ප්‍රවේශ මාර්ග සම්බන්ධ කිරීම මඟින් කර්මාන්ත, සංචාරක, ධීවර හා කෘෂිකාර්මික අංශයන්හි වර්ධනය දිරිමත් කිරීම මඟින් දකුණු පළාතේ ආර්ථික සංවර්ධනය සඳහා සහායවීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම් අනුව,කොට්ටාව සිට ගොඩගම දක්වා කිලෝමීටර් 126 ක් වූ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 661.14 ක් විය. ඉන් එජඩො මිලියන 138.21 ක් හෙවත් සියයට 20.9 ක් පින්නදූව සිට ගොඩගම දක්වා අධිවේගී මාර්ගයේ කිලෝමීටර් 30.25 ක් සඳහා මූල්‍යායනය කිරීමට චීන අපනයන හා ආනයන බැංකුව එකඟ වී තිබුණි. දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා සමස්ත අරමුදල් ප්‍රභවයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **ණය ලබාදෙන ලද නියෝජිතායතනය** | **එකඟවූ මුදල එජඩො මිලියන** | **ප්‍රතිශතය** |
|---|---|---|
| | | % |
| ආසියානු සංවර්ධන බැංකුව | 186.00 | 28.13 |
| ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වූ ජපන් බැංකුව | 103.00 | 15.58 |
| නෝඩික් සංවර්ධන බැංකුව | 5.40 | 0.82 |
| ස්විඩන් ජාත්‍යන්තර සංවර්ධන සංගමය | 0.80 | 0.12 |
| චීන අපනයන හා ආනයන බැංකුව | 138.21 | 20.90 |
| ශ්‍රී ලංකා රජය | 227.73 | 34.45 |
| එකතුව | 661.14 | 100.00 |

කොට්ටාව සිට ගාල්ල පින්නදූව දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගය මහජනතාව සඳහා 2011 නොවැම්බර් 27 දින විවෘත කරන ලද අතර පින්නදූව සිට මාතර ගොඩගම දක්වා අධිවේගී මාර්ග කොටස 2014 මාර්තු 16 දින විවෘත කරන ලදි. ඉදිකිරීම් වැඩ නිම කිරීමෙන් පසු, ණය මුදලෙන් ඉතිරි වන මුදල් දළ වශයෙන් රු.බිලියන 4.4 ක මුදල දක්ෂිණ අධිවේගී මාර්ගයට සෘජුවම හෝ වක්‍රව සම්බන්ධ වන මාර්ග 14 ක් හා පාලම් 2 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා උපයෝජනය කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය තීරණය කර තිබුණි. ව්‍යාපෘති කාර්යයන් 2016 දෙසැම්බර් 31 වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීමකි.

## 1.4 විගණකගේ වගකිම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන  බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උපදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරික්ෂා කිරීම්ද එම පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී  ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් , ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම් වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

----------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම්වල මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2015 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුළ | 2015 දෙසැම්බර් 31 දක්වා |
| --------- | ----------------------- | | -------------- | ------------- | ------------ |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| චීන එක්සිම් බැංකුව | 138.21 | 15,895 | 4,313.00 | 4,307.00 | 14,925 |
| ශ්‍රීලංරජ | 24.39 | 2,805 | 118.50 | 118.40 | 3,359 |
| | --------- | --------- | ----------- | ----------- | --------- |
| | 162.60 | 18,700 | 4,431.50 | 4,425.40 | 18,284 |

**3.2 භෞතික කාර්ය සාධනය**

**--------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබුණු තොරතුරු අනුව, පින්නදූව සිට ගොඩගම දක්වා අධිවේගී මාර්ග කොටස ඉදිකිරීම පිළිබඳ ඇස්තමේන්තුගත පිරිවැය මත ඉතිරිකිරීම් උපයෝජනය කිරීම සඳහා දකුණු පළාතේ වෙනත් ජාතික මාර්ග 06 ක් හා පාලම් 02 ක් පුනරුත්ථාපනය කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය ආරම්භකව තීරණය කර තිබුණි. එබැවින් පින්නදූව සිට ගොඩගම දක්වා අධිවේගී මාර්ග කොටස ඉදිකිරීම සඳහා යෙදී සිටි කොන්ත්‍රාත්කරු සමඟ 2014 ජනවාරි 28 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබූ අතර රු. මිලියන 3,875.7 ක පිරිවැයකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. අදාළ අතිරේක වැඩ ප්‍රධාන කොන්ත්‍රාත්තුවේ විචලනයන් ලෙස සැලකීම සඳහා ණය දෙන නියෝජිතායතනය විසින් උපදෙස්දී තිබූ බව උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් පැහැදිලි කර තිබූ අතර කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධාන වෙනස් කිරීමකින් තොරව එම කොන්ත්‍රාත්කරුටම ප්‍රදානය කර තිබුණි. ලැබුණු තොරතුරු අනුව, එම ජාතික මාර්ග හා පාලම් වල පුනරුත්ථාපන වැඩ 2015 දෙසැම්බර් 31 දිනට බොහෝදුරට නිම කර තිබුණි.

(ආ) තවද, එක්සත් ජනපද ඩොලරයට ප්‍රතිරූපීව ශ්‍රී ලංකා රුපියල අව ප්‍රමාණයවීම හේතුවෙන්, 2015 දෙසැම්බර් 31 දිනට මාර්ග පුනරුත්ථාපන වැඩවල පිරිවැය ඉතිරි කිරීම් ලෙස රු.මිලියන 19.30 ක මුදලක්ද පැවතුණු අතර දකුණු පළාතේ වෙනත් මාර්ග 08 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා එම ඉතිරිකිරීම් යොදා ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පසුව තීරණය කර තිබුණි. එම මාර්ගවල පුනරුත්ථාපන වැඩ 2016 ජුනි 30 දිනට නිම කර තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රගති වාර්තා අනුව, දකුණු පළාතේ ජාතික මාර්ග 06 ක පුනරුත්ථාපන වැඩ මාස 01 සිට මාස 21 දක්වා වූ පරාසයක ප්‍රමාදයන් සහිතව 2015 දෙසැම්බර් 31 දිනට බොහෝදුරට නිම කර තිබුණි. මාර්ග පුනරුත්ථාපන වැඩ නිම කිරීමේ ප්‍රමාදයන් මත ප්‍රමාද ගාස්තු අයකිරීම සඳහා අවබෝධතා ගිවිසුමේ විධිවිධාන සලසා නොමැති බවත් ඒ සඳහා කාලය දීර්ඝ කිරීම් නිර්දේශ කිරීමට කටයුතු කරන බවත් උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් පැහැදිලි කර තිබුණි.

(ආ) ගාල්ල මහ නගර සභාව සමඟ වූ ආරාවුල හේතුවෙන් ව්‍යාපෘතිය විසින් කළුවැල්ල - කරාපිටිය - තලගහ මාර්ගයේ කිලෝ මීටර් 02 ක පුනරුත්ථාපන වැඩ කපා හැර තිබූ බව 2016 ජූලි මාසයේදී විගණකවරුන් විසින් කරන ලද භෞතික පරීක්ෂණයේදී අනාවරණය විය. වදුරඹ - මාපලගම මාර්ගයේ කිලෝමීටර් 04 + -255 සිට කිලෝමීටර් 04+275 දක්වා කොටසේ ගැඹුරු බෑවුමේ ඉවත් කිරීමට අවශ්‍යව තිබූ දුරකථන කණු පුනරුත්ථාපන වැඩ අවසාන වීමෙන් පසුවද ඉවත් කර නොතිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය. එබැවින් ඒ පිළිබඳ ආරක්ෂක ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ගොඩගම පාලමේ උඩු පැත්තේ එක්ස්පැන්ෂන් ජොයින්ට් වල ( Expansion Joint) ආවරණ ස්ටැබ්ස් (Stabs) විධිමත් පරිදි සවිකර නොතිබූ බවත් අඟල් 06 ක විවරයක් පැවති බවත් වැඩ බිම් පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද පාලමේ මතු පිට ස්ථාන කිහිපයක පිපිරීම්ද නිරීක්ෂණය විය.

(ඈ) ප්‍රධාන සාම්පල හා කොන්ක්‍රීට් ඇතිරීම් පිළිබඳ තත්ත්ව පරීක්ෂණ වාර්තා අනුව , වදුරඹ - මාපලගම මාර්ගයේ, යක්කලමුල්ල - ඉමදූව මාර්ගයේ හා කළුවැල්ල - තලගහ මාර්ගයේ රිය මඟ හි (Carriage Way) හා කොන්ක්‍රීට් ව්‍යුහයන්හි තද කිරීම් ඇතැම් ස්ථානවල සම්මත අවශ්‍යතාවයන්ට අනුව ඉටුකර නොතිබුණි. කොන්ත්‍රාත්කරුවන්ගේ ගෙවීම් වලින් ඒ සඳහා මුදල් අඩුකර ගැනීම් සිදුකර තිබුණද, ඉහත සඳහන් අඩුපාඩු තිබීම හේතුවෙන් මාර්ගයේ කල් පැවැත්ම සඳහා එය බලපානු ඇත.

## 3.4 ඵල රහිත ගනුදෙනු

---------------------

පුනරුත්ථාපන වැඩ සඳහා අත්කර ගන්නා ලද ඉඩම් සඳහා වන්දි නිරවුල් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘතිය විසින් 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 5.23 ක් වූ පොලී ගෙවා තිබුණි.